**මන්මුනේ බටහිර ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව**
**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්මුනේ බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ අවසාන දිනට වූ ශේෂ පත්‍රය ප්‍රකාරව, සමුච්චිත අරමුදලේ සහ වෙන්කිරීම් වශයෙන් රු.114,567,960 ක් දක්නට ලැබුණත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය වශයෙන් රු.116,068,693 ක් ඉදිරියට ගෙනැවිත් තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු.1,500,733 කින් සමුච්චිත අරමුදල මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) විවිධ වැඩසටහන් සඳහා ලැබූ රු.4,624,780 ක් වැකර තිබුණි. මෙහිදී ද්‍රව්‍ය වියදම් ගිණුම් හර හා මූලධන ආධාර ගිණුම් බැර වශයෙන් ගිණුම් නොතබා තැන්පත් ගිණුම හරහා හර හා බැර සටහන් තබා තිබුණි. මෙම ක්‍රියාවෙන් මූලධන ආධාර ගිණුම සහ ද්‍රව්‍ය වියදම් ගිණුම් රු.4,624,780 කින් අත් හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් ජේ.සී.බී. වාහනය කුලියට දීමෙන් ලැබී තිබූ රු.727,200 ක ආදායම්, ආදායම් ගිණුම්වල නොදක්වා තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් රු.727,200 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විශ්ලේෂණය කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල හඳුනාගෙන ඒ සඳහා වාර්ෂික වටිනාකම තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | |
| (i) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 197 වගන්තිය | සෑම මාසයක් අවසානයේදීම පරිභෝජන ගබඩා භාණ්ඩ ලේඛනය ලේකම්වරයා විසින් පරීක්ෂා කොට අත්සන් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 5,728,470කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 3,533,451 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,195,019 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය සමාලෝචනය

(අ) තිරසාර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත

යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 සහ 2017 වර්ෂවලදී රු.1,972,691 ක වියදමින් “සොරුවාමුනෙයි” යන ස්ථානයේ සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ නමුත් මහජන විරෝධය හේතුවෙන් එය එදින සිට භාවිතයට ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල සිට සභාව විසින් එහි බල ප්‍රදේශය තුළ රැස්කරනු ලබන කසළ හා අපද්‍රව්‍ය වෙන් නොකර කරෙයියාක්කන්තීවූ යන ස්ථානයේ පිහිටි පුද්ගලික ඉඩමක බැහැර කරමින් තිබූ අතර, එම ප්‍රදේශයේ පරිසරයට හානි සිදු වී තිබූ අතර, වන සතුන්ටද හිංසා සිදු වෙමින් පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් පවත්වාගෙන යනු ලැබූ මුදල් පොත අනුව සෑම මාසයක් අවසානයේදී සාමාන්‍යයෙන් රු.මිලියන 18.6 කට අධික අතැති ශේෂයක් පැවතුණත්, ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන මෙම මුදල් ඵලදායී වැඩසටහන්වල යෙදවීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) රු.1,225,500 ක වියදමින් 2017 දෙසැම්බර් 18 දින අවමංගල රථයක් මිලදීගෙන තිබුණි. 2017 ජූලි 10 දිනැති අංක BT/MW/PS/SPS/2017 දරන ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිපිය අනුව, ග්‍රාම සංවර්ධන සමිති සභාපතිවරුන්, ප්‍රජා මධ්‍යස්ථාන සභාපතිවරුන් සහ මහජනතාවගේ අදහස් අනුව මෙම අවමංගල රථය මිලදී ගැනීමෙන් මහජනතාවට අවම වශයෙන් ප්‍රතිලාභ ලැබෙන බව සඳහන් කර තිබූ නමුත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර වාහනය මිලදී ගෙන තිබුණි. වාහනය මිලදී ගත් දින සිට 2018 අප්‍රේල් 12 වන විගණන දින වන විටත් කිසිඳු භාවිතයකින් තොරව ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ නවතා තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සහකාර තනතුරට අනුමත කළ සේවක සංඛ්‍යාව 06 ක්ව තිබූ නමුත් දෙදෙනෙකු පමණක් 2016 වර්ෂයේ සිට සේවයේ යොදවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන පුස්තකාල 07 ක් පැවතුණද, පුස්තකාලයාධිපති තනතුරට අනුමත සේවක සංඛ්‍යාව 02 කි. එසේ වුවත්, 2017 ජූනි 02 දින එක් අයෙකු බඳවාගෙන තිබූ අතර අනෙකුත් පුස්තකාල සඳහා පුස්තකාල සහකාරවරුන්, පුස්තකාලයාධිපති තනතුරේ සේවය කරමින් පැවතුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 සහ 2016 වර්ෂවල ගෙවීම් ලේඛන අනුව ලීටර් 33,607 ක ඩීසල් මිලදී ගෙන තිබුණි. ඉන්ධන ලේඛනය අනුව 2015 වර්ෂයේ ජනවාරි 01 දින ඩීසල් ආරම්භක තොගය ලීටර් 708ක් විය. 2015 සහ 2016 වර්ෂවල වාහනවලට භාවිතා කිරීම සඳහා ලීටර් 33,607 ක් රු.3,192,627 කට මිලදීගෙන තිබුණි. එසේ වුවත්, වාහන ධාවන සටහන් අනුව, අදාල වර්ෂයේ ඩීසල් ලීටර් 30,470 ක් පමණක් භාවිතා කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින ඩීසල් අතැති ශේෂය වශයෙන් ලීටර් 3,845 ක් වෙනුවට ලීටර් 375 ක ඩීසල් පමණක් අතැති තොග වශයෙන් දක්වා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු.329,650 ක් වටිනා ලීටර් 3,470 ක ඩීසල්වල පාඩුවක් සභාවට සිදු වී තිබුණි.

(ආ) ඩෙංගු මර්ධන වැඩසටහන යටතේ පළාත් සභා සේවකයින් සේවය සඳහා යොදා ගැනීමට නැගෙනහිර පළාත් පාලන ආණ්ඩුකාරවරයාගේ 2017 මාර්තු 30 දිනැති ලිපිය මඟින් සභාව සඳහා සේවකයින් 04 දෙනෙකු දෛනික පදනමින් සේවය කිරීම සඳහා නම් සඳහන් කර තිබූ නමුත්, කිසිදු බඳවා ගැනීමේ ලිපියක් ලබා නොදී සභාවේ ලේකම්වරයා විසින් සේවකයින් 14 දෙනෙකු ඩෙංගු කටයුතු වෙනුවෙන් රාජකාරී කළ බවට රු.304,700 ක ගෙවීම සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණි. මෙම සේවකයින්ගේ පැමිණීමේ ලේඛන අස්ථානගත වී ඇති බව විෂය භාර නිලධාරීවරයා ලිඛිතව දන්වා තිබුණි. තවද, සභාව විසින් පවත්වාගෙන යනු ලබන චෙක්පත් ලේඛනය අනුව මෙම ඩෙංගු මර්ධන කාර්යයන් සඳහා  චෙක්පත් ලබාගත් ඇතැම් අයගේ අත්සන් වවුචරයේ සඳහන් අත්සන් සමඟ එකිනෙකට වෙනස් වී තිබුණි.

**3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සභාව සතු අංක EP-LE 7516 දරන ලොරි රථය 2013 වර්ෂයේ සිට ධාවනය සඳහා යොදවා නොගෙන සභා පරිශ්‍රයේ නවතා තිබූ අතර මෙම රථය අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

ග්‍රාමීය ප්‍රදේශවල කි.මී.1000 ක් දිග මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් 2017 මාර්තු 24 දිනැති අංක 03/2017 දරන පළාත් සභා මාර්ගෝපදේශ ප්‍රකාරව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මිනුම් සහ තක්සේරු කිරීම්වල සත්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පළාත් සභා ඉංජිනේරුවරයාගේ අනුමැතිය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වුවත්, ඒ පිළිබඳ සැලකිලිමත් නොවී සමාලෝචිත වර්ෂයේ විවිධ ස්ථානවල පිහිටි කොන්ක්‍රීට් මාර්ග 05 ක් ඉදිකිරීම සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු කිසිවක් සංශෝධනය නොකර ඒ ආකාරයෙන්ම පිළියෙල කර තිබුණි. මෙය තාක්ෂණ නිලධාරී විසින් නියමිත ස්ථානවලට ගොස් පරීක්ෂා කර ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල නොකළ බවට හෙළිදරව් වී තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වර්ග 05 ක ආදායම් මූලාශ්‍ර සඳහා වන ඇස්තමේන්තු රු.6,045,000 ක ආදායම්වලින් අයකර තිබූ ආදායම් රු.1,100,160 ක් අතර 39%  සිට 99% දක්වා විචලනයන් නිරීක්ෂණය

විය. මෙය අයවැය පිළියෙල කිරීමේදී නිසි  අවධානයකින් තොරව පිළියෙල කර තිබූ බව හෙළිදරව් කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ගිණුම්කරණය | ලෙජර ගිණුම් යාවත්කාලීනව හා නිසි අයුරින් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) අයවැය පිළියෙල කිරීම | අයවැය පිළියෙල කිරීමේදි අදාල විෂයයන් විශ්ලේෂණය කිරීම සහ අවධානය යොමු කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) ආදායම් කළමනාකරණය | ආදායම් මූලාශ්‍රයන් හඳුනා ගෙන ආදායම් රැස් කිරීමට කටයුතු කිරීම. |